3 , 4 සහ 5 වසර ඉගෙනුම ලබන සිසුන්ගේ භාෂා ක්ෂෙත්‍රයේ

(මවුබස) ප්‍රාප්ති මට්ටම් මැනීම සඳහා නිපුණතා පද්ධතියක්

ගොඩනැගීම.

මහනුවර දිස්ත්‍රික්කය ඇසුරින්.

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ 1994/96 වසර

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ

කෘතියකි.

විජයමුනි. චිත්‍රා. ද. සිල්වා මිය,
සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි,
පශ්චාත් උපාධි අධ්‍යාපන
ඩිප්ලෝමා (සම්මාන),
අධ්‍යාපන පති.

අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාල[illegible]

1996 මැයි.

UCLIB
468264

## සංක්ෂේපයෙන්.

විධිමත් පාසල් පද්ධතිය තුළ ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ නියග ශක්තීන් වර්ධනය කිරීම වැදගත් මෙහෙවරකි. මෙහිදී ශිෂ්‍යයා අධ්‍යාපනය ලබන භාෂා මාධ්‍යය පිළිබඳව ඇතිකර ගන්නා නිපුණතා තුළින් ඉහත කී ශක්තීන් මල් ඵල ගැන්වෙයි.

ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක වර්ධනය පිළිබඳව කරුණු දැක්වෙතත් ගුණාත්මක බව පිළිබඳව කරුණු සඳහන් නොවේ. භාෂා ක්ෂේත්‍රයට අදාළව 3, 4 සහ 5 වසර සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් මැනීම සඳහා නිපුණතා පද්ධතියක් ගොඩනැඟීම පිළිබඳව මෙම අධ්‍යයනයෙන් කරුණු ඉදිරිපත් කෙරෙයි.

ප්‍රාථමික අධ්‍යාපනයේ පොදු අරමුණු අතර මව්බස කුසලතා වර්ධනය කිරීම සඳහන් කොට ඇතත් එම අරමුණ සාක්ෂාත් වී ඇති ප්‍රමාණය ගැන සතුටට පත් විය නොහැකිය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දශක දෙකහමාරකට ආසන්න කාලයක් තුළ නියැලෙමින් මව්බස ක්ෂේත්‍රය තුළින් ලැබූ අත්දැකීම් මත මෙවැනි පර්යේෂණයක් කිරීම යුදුසු ලෙස පර්යේෂකයා සිතා ඇත.

පළමු වෙනි පරිච්ඡේදය හැඳින්වීම සඳහා වෙන්කළ අතර ගැටළුව ඉදිරිපත් කිරීම, ගැටළුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම, අධ්‍යයන මාතෘකාවේ දැක්වෙන පද නිර්වචනය සහ පර්යේෂණ අරමුණු කෙටියෙන් ඉදිරිපත් කිරීම සිදුකර ඇත.

දෙවෙනි පරිච්ඡේදයෙන් භාෂාවේ වැදගත්කම ගැන දක්වා ඇති අතර ඒ යටතේ භාෂාව යනු කුමක්ද? සවන්දීම, කථනය, කියවීම හා ලිවීම යන භාෂා කාර්යයන් පිළිබඳව විවිධ නිර්වචනයන් ඔස්සේ කරුණු ඉදිරිපත් කර ඇත.

තුන්වෙනි පරිච්ඡේදයෙන් අදාළ සාහිත්‍යය විමර්ශනයට ලක් කොට ඇත. ඒ යටතේ මෙතෙක් භාෂා ක්ෂේත්‍රයේ කරන ලද දේශීය හා විදේශීය පර්යේෂණ තුළින් මෙම පර්යේෂණයට ඇති අදාළත්වය කෙරෙහි අවධානය යොමුකර ඇත.

හතරවන පරිච්ඡේදය වර්තමාන අධ්‍යයනයට වෙන්කර ඇත. අධ්‍යයන අරමුණු සවිස්තරව දැක්වීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රම ශිල්ප, මිනුම් උපකරණ පිළිබඳ විස්තර, පර්යේෂණ ක්‍රම පිළිවෙත, පර්යේෂණ නියැදිය, අධ්‍යයනයේ දී මතුවිය හැකි සීමා පිළි-බඳව කරුණු ඉදිරිපත් කර ඇත.

පස්වන පරිච්ඡේදය දත්ත විශ්ලේෂණය හා අර්ථ කථනය සඳහා වෙන්කර ඇත. මේ යටතේ එක් එක් වසරට අදාළව ලිඛිත හා වාචික පරීක්‍ෂණ, ප්‍රශ්නාවලිය හා සම්මුඛ පරීක්‍ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරෙයි. මෙම පරිච්ඡේදය අවසානයේ දී ඉහත දත්ත විශ්ලේෂණ තුළින් ආභාසය ලැබ නිපුණතා පද්ධතියක් ගොඩ නැගීමට පර්යේ-ෂකයා උත්සාහ දරා තිබේ.

හයවන පරිච්ඡේදය නිගමන හා යෝජනා වෙනුවෙන් වෙන්කර ඇත. මේ යටතේ මෙම පර්යේෂණයෙන් එළඹී නිගමන, වෙනත් පර්යේෂණ නිගමන තුළින් මේ පර්යේ-ෂණයේ නිගමනවලට බලපා ඇති කරුණු ගුණාත්මක භාෂා වර්ධනයට අදාළ යෝජනා සහ අනාගත පර්යේෂණ සඳහා ඉඟි සඳහන් කර ඇත.

උපග්‍රන්ථ යටතේ ලිඛිත පරීක්‍ෂණ හා වාචික පරීක්‍ෂණ දත්ත වලට අදාළ සංඛ්‍යා විද්‍යාත්මක දර්ශක තොරතුරු හා නිපුණතා මට්ටම් පිළිබඳ ලකුණු කාණ්ඩ, එක් එක් වසර අනුව දක්වා තිබේ.

ඇමුණුම් යටතේ ලිඛිත පරීක්‍ෂණ ලකුණු, වාචික පරීක්‍ෂණ ඇගයීම් පත්‍රිකා, පෙර හා පසු පරීක්‍ෂණ ප්‍රශ්න පත්‍ර ගුරු භවතුන් සඳහා ප්‍රශ්නාවලිය, නියැදියේ පාසල් පිළිබඳ සංක්‍ෂිප්ත විස්තරයක්, ලිඛිත පරීක්‍ෂණයේ දී සිසුන්ගේ විවිධ මට්ටම් දැක්වෙන පිළිතුරුපත් කිහිපයක් ඉදිරිපත් කොට ඇත.

පර්යේෂණය සඳහා පරිශීලනය කළ ග්‍රන්ථාවලියේ තොරතුරු ද අවසන් වශයෙන් ඇතුළත් කොට ඇත.